# අභිලේඛන මගින් හෙළිවන ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය (අනුරාධපුර හා පොළොන්නරු යුග ඇසුරෙන්)


එම්. ඩබ්.එන්.ටී. සුමනසේන[*], එච්.එල්. ජයශානි[**]

ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
[*]nuwan.medawattha@gmail.com
[**]jayashani1127@gmail.com



**ප්‍රමුඛ පදඃ** මැණික් කර්මාන්තය, අභිලේඛන, ආභරණ, බුදු පිළිම, රාජානුග්‍රහය


## හැඳින්වීම

පුරාතන අවධියේ සිටම ලංකාව මැණික් සඳහා ප්‍රසිද්ධියක් ඉසිලූ බව පැහැදිලි වේ. මෙම මැණික් පිළිබඳ ඉතිහාසය ආරම්භ වන්නේ විජය රාජ්‍යය සමයේ සිට ය. ස්වභාවික සම්පතක් ලෙස සලකනු ලබන මෙම මැණික් විවිධ වර්ගයන්ගෙන් දැකගත හැකිය. ලංකාවේ වැසියන් තම අපල දුරු කර ගැනීම සඳහා හා ආගමික කටයුතුවලදී පූජා භාණ්ඩයක් ලෙස ද මැණික් භාවිත කර තිබේ. බොහෝ විට අතීතයේදී මැණික් බහුල ලෙස භාවිත කරනු ලැබුවේ රජවරු විසිනි. රජවරුන්ගේ ධන වත්කම පෙන්වීම සඳහාත්, ආභරණ හා ඇඳුම් පැළඳුම් අලංකාර කර ගැනීම සඳහාත් මැණික් භාවිත කරනු ලැබීය. මේ අනුව පෙනී යන්නේ පුරාතනයේ සිටම මැණික් කර්මාන්තයට රාජානුග්‍රහය පැවති බවයි. මැණික් හා බැඳී පවතින ජනප්‍රවාද ද පවතී. බොහෝ ගැමියන්ගේ විශ්වාසය වන්නේ නාගයන් සතුව මැණික් පවතින බවයි. අනුරාධපුර යුගයේ හා පොළොන්නරු යුගයේ පැවති මැණික් කර්මාන්තය අභිලේඛනවලින් සනාථ කළ හැකි ද යන්න විමසා බැලීම වැදගත් ය.

## ක්‍රමවේදය

අනුරාධපුර යුගයේ හා පොළොන්නරු යුගයේදී මැණික් කර්මාන්තය පැවති බවට සාධක අභිලේඛනවලින් සනාථ කිරීම මෙහි අරමුණ විය. අධ්‍යයන ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සිදු විය. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයට විශේෂ තැනක් ලබාදුනි. ප්‍රාථමික මූලාශ්‍රය ප්‍රධාන තැන්හි තබාගනිමින් ද්විතීයික මූලාශ්‍රය ද අධ්‍යයනය කෙරුණි. පුරාවිද්‍යා මූලාශ්‍රය වශයෙන් ii වන සිරිනාග රජුගේ **වෙස්සගිරිය ශිලා ලිපිය, මිහින්තලයේ අනෛකුට්ටිකන්ද ලිපිය, වෛගිරි විහාර ලිපිය, තම්මැන්නාකන්ද ගිරි ලිපිය, රඹෑව පදර ලිපිය,** නිශ්ශංකමල්ල රජුගේ (ක්‍රි.ව. 1187 - 1196) **ගල්පොත ශිලා ලිපිය** හා **රුවන්වැලි සෑ පුවරු ලිපිය, රන්කොත් දාගැබ් ලිපිය, ජේතවනාරාමය** අංක 01 **දරණ පුවරු ලිපිය සහ කෝන්ගල බ්‍රාහ්මීය ශිලා ලිපිය** යන ශිලා ලිපි අධ්‍යයනය කරනු ලැබීය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ඈත අතීතයේ පටන් මැණික් හමුවන දිවයිනක් ලෙස ලංකාව ප්‍රසිද්ධියට පත් විය. මැණික් කර්මාන්තය පිළිබඳ මූලාශ්‍රය තොරතුරු බහුල වශයෙන් හමුවන අතර එය පුරාවිද්‍යාත්මක සාධකයන්ගෙන් තවදුරටත් සනාථ වේ. විජය රජුගේ පැමිණීමට පෙර සිටම මැණික් සම්බන්ධ විවිධ කතා පුවත් මණිකණ්ඨ ජාතකය, විදූර ජාතකය වැනි ජාතක කථාවල සඳහන් වේ. මැණික් කර්මාන්තය

අතීතයේ සිට රජු භාරයේ පැවති අතර, එය රජුගේ ප්‍රධාන ආදායම් මාර්ග අතරින් එකක් විය. පණික්කන්කුළම ලිපිය, මාම්පිට විහාර ලිපිය, ගල්ගමුව, ගල්ගේ, කෝන්ගල යනාදී ශිලා ලිපිවල මැණික් කර්මාන්තයේ යෙදුණු පුද්ගලයන් පිළිබඳ ව සඳහන් වේ. ***දෙමැදඹය ලිපියේ*** **''ම චුඩ රඣග මණිකාරංග ශිල ඉටක කටක අගතශ ගතෙශ....''** යනුවෙන් මහාචුඩික රජුගේ මණිකාරයෝ උළු හා ගල් කැට වන් වූ මැණික් කටයුතුවල නිරත වූ බව සඳහන් වේ. මෙයින් ගම්‍ය වන්නේ රජවාසයේ අවශ්‍යතා සඳහා මැණික් කර්මාන්තයේ නිරත වූ නිත්‍ය සේවකයන් සිටි බවත්, මැණික් ගැරීම රජුගේ අණසක අනුව ක්‍රියාත්මක වූ බවත්, මැණික්වලින් රාජ්‍ය භාණ්ඩාගාරයට ආදායම් ලැබුණු බවත් ය.

මැණික් කර්මාන්තයේ යෙදුණු පුද්ගලයන්ගේ ගම් පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රයවල මෙන්ම ශිලා ලේඛනවල ද සඳහන් වේ. **කම්මැන්නාකන්ද ගිරි *ලිපියට*** **''මණිකාර ගමක''** යනුවෙන් මැණික් කපන්නන් සිටි ගමක් ගැන සඳහන් වේ. දෙවන සිරිනාග රජුගේ වෙස්සගිරි ශිලා ලිපියෙහි ද මණිකාර ගමක් ගැන සඳහන් වේ. මෙලෙස ගම්මානයන් ද මැණික් කර්මාන්තය සඳහා වෙන් කර තිබීමෙන් මෙකල මැණික් කර්මාන්තය විශාල පරිමාණයෙන් පැවති බව සිතිය හැකිය.

මැණික් කර්මාන්තයක් වශයෙන් පවත්වා ගෙන යාමට පදනම සකස් වූ ආකාරය සොයා බැලීම ද වැදගත් වේ. මැණික් භාවිත කරමින් ආභරණ, ඇඳුම් හා වෙනත් නිර්මාණ කිරීම, ප්‍රතිමා අලංකාර කිරීම, ස්ථූප කර්මාන්තය සඳහා යොදා ගැනීම, තුටු පඬුරු වශයෙන් තෑගි කිරීම, වෙළඳ භාණ්ඩයක් ලෙස යොදා ගැනීම යන අවශ්‍යතා සිදු කිරීම මෙම කර්මාන්තයක් වශයෙන් බිහි වීමට හේතු වන්නට ඇත. මේ අනුව ආර්ථික ආගමික හා සමාජීය යන සාධක මත මැණික් කර්මාන්තය ගොඩනැගුණු බව පැහැදිලිය.

තුටු පඬුරු වශයෙන් මැණික් භාවිත කිරීම ඈත අතීතයේ සිටම පැවතුණි. නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ශිලා ලිපියෙහි රජු දිළින්දන් සතුටු කිරීම සඳහා රන්, රිදී, මුතු, මැණික් පරිත්‍යාග කළ බව සඳහන් වේ. මෙයට අමතරව ඔහුගේ *රුවන්වැලි සෑ පුවරු ලිපියේ* **''රන් රිදී මසුරන් මුතු මැණික් වස්ත්‍රාභරණාදි වූ උන් උන් කැමති වස්තු හා සරත් ගම්බිම් දී... ''** යනුවෙන් සහ ***රන්කොත් දාගැබ් ලිපියෙහි*** **''පූර්ව රාජ්‍යයන් දවස අනෙක වධ බන්ධන තාඩනයෙන් හා ගොමහිෂාදී සවර්ව ස්වහරණයෙන් ඉතා දුරස්ථවැ ගියා වූ ලෝකවාසීනට දඬනාදි නොඑක් දෙය හාර මුතු මැණික් පබළු ඇතුලු වූ නොඑක් රත්න ද...''** යනුවෙන් මැණික් පිළිබඳව සඳහන් වේ. රජවරුන්ගේ සුභදතාව හා ත්‍යාගශීලී බව පෙන්වීම සඳහා මැණික් භාවිත කිරීම තුළින් අතීතයේ පටන් මැණික්වලට තිබූ වැදගත් ස්ථානය ගම්‍ය වේ.

ආගමික වශයෙන් බලන කල බොහෝ රජවරු සිද්ධස්ථාන වෙත මැණික් පූජා කර ඇති බව තොරතුරු අනාවරණය වේ. සාහිත්‍ය මූලාශ්‍රය අනුව රජවරු බුදු පිළිමවල නේත්‍ර පිහිටු වීම සඳහා මැණික් භාවිත කළ බව සඳහන් වේ. අභිලේඛන අනුව බුද්ධ ප්‍රතිමා සඳහා පමණක් නොව වෙනත් ප්‍රතිමා සඳහා ද මැණික් එබ්බවූ බවට සාධක ඇත. **ජේතවනාරාම අංක 01 දරන ලිපියෙහි ''මිහිදන් මහසල් පිළිමේ තුල් (දැති) මිණින් ඇස තබවා....''** යනුවෙන් සඳහන් වීමෙන් එය සනාථ වේ.

දේශීය වශයෙන් පමණක් නොව විදේශීය වශයෙන් ද ලංකාව මැණික් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ව පැවති අතර, විදේශීය වෙළෙන්දන්ගේ වෙළඳ භාණ්ඩ අතර මැණික් සඳහා ද ප්‍රධාන ස්ථාන පැවතුණි.

මේ අනුව ලංකාවට විදේශීය වෙළඳුන් පැමිණි අතර,ඒ බව ශිලා ලිපිවල ද සඳහන් වේ. ***හඳගල ලිපියේ "නවික"*** යනුවෙන් සඳහන් වීමෙන් එය පැහැදිලි වේ. **පරමාකන්ද, ආඬියාගල, බෝවත්තේගල, කඳුරුවැව** යන ශිලා ලිපිවලට අනුව ද මෙරට විදේශීය වෙළඳුන් සිටි බව පැහැදිලිය. වෙළඳාම සඳහා මෙම වෙළඳුන් ඇතැම් විට මැණික් ද භාවිත කරන්නට ඇතැයි සිතිය හැකිය.

අනුරාධපුර හා පොළොන්නරු යන යුගයන්හි මැණික්, කර්මාන්තයක් වශයෙන් ගොඩනැගුණු බව ශිලා ලේඛනවලින් සනාථ වන අතර එම නිසා ලංකාවේ දේශපාලන ආර්ථික සමාජ ගමන්මග හැඩගැස්වීමෙහිලා මැණික් කර්මාන්තය ප්‍රබල දායකත්වය ලබා දී තිබේ.

ඉහත මූලාශ්‍රය තුලනාත්මක අධ්‍යයනය කිරීමෙන් තහවුරු වූයේ අනුරාධපුර හා පොළොන්නරු යුගවලදී විවිධ සාධක පදනම් කරගෙන ජනතාව මැණික් භාවිත කළ බවයි. අභිලේඛනයන්ට අනුව මෙම යුගයන් දෙකෙහිදී ම මැණික්, කර්මාන්තයක් ලෙස පැවතුණු බව තහවුරු විය. මැණික් කර්මාන්තය සඳහා වෙන් වූ ගම්මාන පැවතීම තුලින් ද එය තහවුරු විය. මෙම යුගයන් දෙකෙහිදී ම මැණික් සඳහා රජවරුන්ට විශේෂ අයිතියක් පැවති බව පෙනේ. රටේ පවතින වටිනා ද්‍රව්‍ය සියල්ලම රජුට අයිති යන පදනම මත රජවරු මැණික් වර්ග තම ස්වයං පරිභෝජනය සඳහා යොදා ගත් අවස්ථා ද පෙනේ. රජවරු පොදු ආගමික කටයුතු සඳහා ද මැණික් භාවිත කළ බව තහවුරු විය. මෙම යුගයන් දෙකෙහිදී ම වෙළඳ භාණ්ඩයක් වශයෙන් ද මැණික් භාවිත කළ බව පෙනී යයි. මේ අනුව අනුරාධපුර හා පොළොන්නරු යුගවලදී මැණික් කර්මාන්තයට විශේෂ ස්ථානයක් හිමි විය. එය අභිලේඛන මඟින් සනාථ වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


***Epigraphia Zeylanica.*** Vol. I. (1919) Wickremasinghe, D.M. De Silva (ed. and tr.) Oxford University Press, London.

***Epigraphia Zeylanica.*** Vol. II. (1929) Wickremasinghe, D.M. De Silva (ed.), London.